# කම්කරු දෙපාර්තමේන්තුව

## කම්කරු දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

## தொழில் திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகள் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்

## Department of Labour

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports labled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය 183

**Format (No.01)**

ආයතනයේ නම : කම්කරු දෙපාර්තමේන්තුව

| කමිටුව විසින් හඳුනා ගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන ප්‍රගතිය |
|---|---|
| 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු, දෙවන හා තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි. | මාස තුනකට වරක් GPS මෘදුකාංගයේ මුරපද වෙනස් කිරීමට කටයුතු කර ඇත. |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන සෑම විගණන විමසුමක් සඳහාම මේ වන විට මසක් තුල පිළිතුරු ලබාදීමට කටයුතු කරමින් පවතී |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහාද මසක් තුල පිළිතුරු ලබා දීමට මේ වන විට කටයුතු කරමින් පවතී. |
| 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | 2020 වර්ෂයේ සහ 2021 වර්ෂයේ මුල් භාගයේදී දිවයින පුරා පැතිර ගිය කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ඉන්ධන තුලන ක්‍රියාවලිය සියළුම වාහන සඳහා සිදු කිරීම ප්‍රායෝගිකව විශාල ගැටළුවක් වූ බැවින් වාහන 19ක පමණක් ඉන්ධන තුලන ක්‍රියාවලිය සිදු කිරීමට හැකි වුණි. ඉන්පසු 2022 වර්ෂයේදී ඉන්ධන තුලනය සිදු කර වාර්තාවන් ඉදිරිපත් කරන ලෙසට සියළුම කාර්යාල දැනුවත් කල අතර, පසුව ඇති වූ ඉන්ධන හිඟය හා කෝටා ක්‍රමය නිසා අවශ්‍ය පරිදි ඉන්ධන සොයා ගැනීමට නොහැකි වූ බැවින් දැනට ඉන්ධන තුලන ක්‍රියාවලිය සිදු කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. නමුත් 2021 හා 2022 වර්ෂයේදී ඉන්ධන තුලනය කිරීම සඳහා අවශ්‍ය කමිටු ආදිය පත්කර අවසන් කර තිබූ අතර, උක්ත හේතූන් නිසා සියළුම වාහනවල ඉන්ධන තුලන ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි විය. ඉදිරියේදී ඉන්ධන කෝටා ක්‍රමය ඉවත් වූ පසු නැවත ඉන්ධන තුලන ක්‍රියාවලිය සැලසුම් කල පරිදි ආරම්භ කරනු ලැබේ. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | ණය ශේෂ අය කර ගැනීමට ගෙන ඇති ක්‍රියා මාර්ග -<br>1. ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත.<br>2. ණයකරුවන්ට සිහි කැඳවීම් යවා ඇත.<br>3. මැතිවරණ කොමිසමෙන් ලිපිනයන් තහවුරු කර ගැනීමට ලිපි යවා ඇත.<br>4. ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර ඇත. |

| | |
|---|---|
| පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 අනුව වර්තමානයේ කටයුතු කරමින් පවතී. |
| මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම මු.රෙ. 371 ප්‍රකාරව කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කරන ලෙසට තත්කාර්යය අතුරු අග්‍රිම ලබාගන්නා සියළුම කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |
| සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | කම්කරු දෙපාර්තමේන්තුවේ 2020 වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2021.10.21 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. එම වසරේ පැවති කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදු විය. එසේම, 2021 වාර්ෂික කාර්ය සාධන වාර්තාවද මේ වන විට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. 2022 වාර්ෂික කාර්යය සාධන වාර්තාව මෙන්ම ඉදිරි වාර්ෂික වාර්තාද නියමිත කාලය තුළදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. |
| ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | කම්කරු දෙපාර්තමේන්තුව විසින් www.labourdept.gov.lk යන වෙබ් අඩවිය වර්තමානයේදී පවත්වාගෙන යනු ලබන අතර එහි “අප අමතන්න” යන Tab එක යටතේ අවශ්‍යතාවයන්, දෝෂ දර්ශන සහ ප්‍රශංසා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ පහසුකම් සලසා ඇත. එසේම, දෙපාර්තමේන්තුව සඳහා නව වෙබ් අඩවියක් සකස් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර එම වෙබ් අඩවිය මඟින්ද මහජනතාවට විමසීම්, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට වැඩිදුරටත් පහසුකම් සලසා දීමට අපේක්ෂිතය. |
| 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධිවිධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත් කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි. | මෙම විස්තර 2020.06.17 දින එවකට පැවති නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය (වර්තමානයේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය) වෙත ඉදිරිපත් කරන ලදි. (ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත.) |
| පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වන විට කම්කරු දෙපාර්තමේන්තුවේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කිරීම සහ එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතින අතර එය 2023.01.31 දින වන විට ප්‍රසිද්ධ කිරීමේ හැකියාව පවතී. |

| | |
|---|---|
| ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | මේ වන විට කම්කරු දෙපාර්තමේන්තුවේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කිරීම සහ එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතින අතර එය 2023.01.31 දින වන විට ප්‍රසිද්ධ කිරීමේ හැකියාව පවතී. |
| රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබූ නමුත් 2021 හා 2022 වර්ෂ සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කරන ලදී. එසේම, 2023 හා 2024 වර්ෂ සඳහාද එම සැලැස්ම යාවත්කාලීන කර කෙටුම්පත් සකස් කර ඇතත්, ඒ අනුව වසර දෙකකට වරක් මෙම සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු යොදා ඇත. |
| සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබූ නමුත් 2021 හා 2022 වර්ෂ සඳහා සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම, එක් සේවකයෙක් සඳහා වසරකට අවම පැය 12 ක අවම පුහුණුවක් ලැබෙන පරිදි සකස් කරන ලදී. එසේම 2023 හා 2024 වර්ෂ සඳහා කෙටුම්පත් කර ඇති සැලැස්මද එම අවම පුහුණුව ලැබෙන පරිදි සකස් කර ඇති අතර ඉදිරි වර්ෂයන් සඳහා සැලැස්ම සකස් කිරීමේදීද එම අවම පුහුණුව ලැබෙන පරිදි සැලසුම් සකස් කිරීමට කටයුතු යොදා ඇත. |
| සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | කම්කරු දෙපාර්තමේන්තුවේ තනතුරු රාශියකට අදාළව අනුමත කාර්ය මණ්ඩලය 3121ක් වන අතර 2022.09.30 දිනට සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 2776 කි.<br><br>ඒ අනුව, 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එක් එක් නිළධාරීන්ට අදාළව කාර්යය සාධන ගිවිසුම් සකස් කර අත්සන් කර ගැනීම සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් මෙය සිදු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් අධ්‍යයනය කරමින් පවතී. |

මනුෂ නානායක්කාර
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය

මනුෂ නානායක්කාර
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියස"
නාරාහේන්පිට කොළඹ 05